# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය,

### අවසාන සෙමෙස්තර පරීක්ෂණය – තෙවන වසර, දෙවන සෙමෙස්තරය - 2016/2017

### PSC 3265 - දේශපාලන භූගෝල විද්‍යාව

පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

**එක් ප්‍රශ්නයකට උපරිම ලකුණු 20කි**

---

1 (a) දේශපාලන භූගෝල විද්‍යාව යනු කුමක්ද?

(b) දහනම (19) වන සියවසෙහි අග භාගයේ සිට දේශපාලන භූගෝල විද්‍යාව වෙනම විෂය ධාරාවක් ලෙස වර්ධනය වූ අයුරු සාකච්ඡා කරන්න.

2 (a) දේශපාලන භූගෝල විද්‍යාවෙහි විෂය පථය කුමක්ද? උදාහරණ සහිතව දක්වන්න.

(b) ලංකාවේ පශ්චාත් යටත් විජිත දේශපාලනය පැහැදිලි කිරීමෙහි ලා දේශපාලන භූගෝල විද්‍යාවෙහි වැදගත්කම දක්වන්න.

3 (a) ඓන්ද්‍රීය රාජ්‍යය පිළිබඳ සංකල්පයට (organic state) ෆෙඩ්රික් රැට්සල්ගෙන් (Friedrich Ratzel) ලැබුණු දායකත්වය පහදන්න.

(b) ඓන්ද්‍රීය රාජ්‍යය පිළිබඳ සංකල්පයට එරෙහිව එල්ල වූ ප්‍රධානම විවේචන මොනවාද?

4 (a) සන්ධියවාදය (Federalism) පිළිබඳ සංකල්පය පහදන්න.

(b) ලෝකයේ පවතින විවිධ සන්ධීය ක්‍රම මොනවාද? එම එක් එක් ක්‍රමයට උදාහරණ දක්වන්න.

(c) සන්ධියවාදය පිළිබඳ ලංකාවේ ඇති විවාදයෙහි පරිණාමය (evolution of the federal debate ) පහදන්න.

5 (a) ඓන්ද්‍රිය රාජ්‍යය පිළිබඳ සංකල්පය (organic state) මත පදනම්ව ෆෙඩ්රික් රැට්සල් විසින් රාජ්‍ය ප්‍රසාරණය පිළිබඳ නීති 7ක් හඳුන්වා දෙන ලදී. ඒවා සාකච්ඡා කරන්න.

(b) රැට්සල්ගේ ජීවත් වීමට ඇති ඉඩ පිළිබඳ සංකල්පය (room to live or '*lebensraum*') සාකච්ඡා කරන්න.

6 (a) නූතන රාජ්‍යයන්ගේ සම්භවය සහ ප්‍රසාරණය (origin and expansion of the modern state) කෙටියෙන් හඳුන්වන්න.

(b) ජාතික රාජ්‍යයන් අද වන විට මුහුණ දෙන ප්‍රධාන අභියෝග මොනවාද? ලංකාවේ උදාහරණ ආශ්‍රයෙන් පහදන්න.

7 (a) රාජ්‍යය පිළිබඳ අදහස (state-idea) සහ 'අතිමූලික හේතුව' (Raison d'etre') යන සංකල්ප හඳුන්වන්න.

(b) ඉහත සංකල්ප දෙක එකිනෙකට වෙනස් බව සමහර භූගෝල විද්‍යාඥයින්ගේ මතයයි. උදාහරණ ආශ්‍රයෙන් පහදන්න.